**පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) - 2014**

-----------------------------------------------------------------------------------------

පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ (පුරනැගුම) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 ඔක්තෝබර් 21 දින එළඹි අංක 2790 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.02 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ (පුරනැගුම) ණය ගිවිසුමට අනුව , එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය, වර්තමානයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 07 පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ, ගිණුම් කටයුතු භාවය හා මූල්‍යමය හා තාක්ෂණිකව ශක්තිමත්වූ පළාත් පාලන ආයතන මගින් දියුණු පළාත් පාලන යටිතල පහසුකම් හා කාර්යක්ෂම සේවා සැපයීමක් ඉටුකර ගැනීමයි. ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 8,940 කට සමාන එජඩො මිලියන 68.8 ක් වූ අතර එයින් රු.මිලියන 7,670 කට සමාන එජඩො මිලියන 59 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. 2012 ජූලි 01 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2015 ජූනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2016 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදී හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි

හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද කාර්යයසාධන වාර්තා සහ වැඩි දියුණු කරන ලද මූල්‍ය වාර්තා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුනේද යන බව.

(ඌ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2014 දෙසැම්බර් 31

දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වුයේද යන බව.

**2. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**2.1 <u>මතය</u>**

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුම් ආරම්භක හා අවසාන ශේෂ, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යනය, සමාලෝචිත වර්ෂයේ අයවැයගත ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාල වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම් | | අරමුදල් උපයෝජනය 2014 වර්ෂය තුළ | | අරමුදල් උපයෝජනය 2014 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 59.00 | 7,670.00 | 10.19 | 1,325.00 | 8.14 | 1,057.55 | 10.97 | 1,425.64 |
| ශ්‍රීලංර | 9.77 | 1,270.10 | 2.88 | 374.28 | 1.54 | 200.00 | 2.08 | 270.96 |
| | 68.77 | 8,940.10 | 13.07 | 1,699.28 | 9.68 | 1,257.55 | 13.05 | 1,696.60 |

2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ වැඩ කටයුතු සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණද 2014 දෙසැම්බර් 31 දින වන විට එජඩො මිලියන 59 ක් වූ මුළු වෙන්කිරීම් වලින් සියයට 18.5 ක් නියෝජනය වන එජඩො මිලියන 10.97 ක ණය මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. එම නිසා ව්‍යාපෘතියේ අවුරුදු 02 ක් වූ ඉතිරි කාලය තුළ සම්පූර්ණ වෙන්කිරීම් භාවිත කිරීමේ හැකියාව ප්‍රශ්නගතව තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ මූලික තාක්ෂණික සහායක වාර්තාවේ පොදු කොන්දේසි අනුව, ප්‍රාදේශිය සභා 171 ක් සඳහා ඔවුන්ගේ පරිපාලන හා වාණිජ ගොඩනැගිලි ඉදිකිරීමට හා ප්‍රජා පහසුකම් වැඩිදියුණු කිරීමට උපරිමය රු.මිලියන 50 බැගින් වෙන්කිරීමට ව්‍යාපෘතිය එකඟ වී තිබුණි.

2015 ජුනි 30 දිනට සිදුකරන ලද උපව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| පළාත | වෙන්කරන ලද මුදල රු.මිලියන | ක්‍රියාත්මක කළ උප ව්‍යාපෘති ගණන | 2015 ජුනි 30 දිනට නිමකළ යුතු උප ව්‍යාපෘති ගණන | නිමකරන ලද උප ව්‍යාපෘති ගණන | ආරම්භ නොකරන ලද උප ව්‍යාපෘති ගණන |
| --- | --- | --- | --- | --- | --- |
| උතුරු මැද | 650 | 24 | 12 | 12 | - |
| මධ්‍යම | 900 | 28 | 18 | 09 | 01 |
| සබරගමුව | 800 | 25 | 18 | 03 | 04 |
| වයඹ | 650 | 20 | 14 | 05 | 01 |
| ඌව | 800 | 28 | 19 | 08 | 01 |
| දකුණ | 1,100 | 29 | 18 | 06 | 05 |
| බස්නාහිර | 500 | 17 | 15 | 02 | - |
| | 5,400 | 171 | 114 | 45 | 12 |

2015 ජුනි 30 දිනට සියයට 10 සිට 50 දක්වා වූ පරාසයක මන්දගාමී භෞතික ප්‍රගතියක් උපව්‍යාපෘති 32 ක නිරීක්ෂණය වු අතර, එදින වන විට කර්මාන්ත 12 ක් ආරම්භ කර නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පැල්මඩුල්ල ප්‍රදේශයේ මැණික් පතල් හා භූගත උමං පැවතීමේ අවදානමක් පැවතියද ප්‍රමාණවත් භූමි සමීක්ෂණයක් හෝ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ සහතිකයක් හෝ නොමැතිව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සඳහා බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමේ ස්ථානය තීරණය කර තිබුණි. කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කරන අවස්ථාවේදී වැඩබිමේ මැණික් පතල් සහ භූගත උමං සොයා ගැනීම නිසා ඉදිකිරීම් කටයුතු අත්හරින ලදී. මේ හේතුවෙන්, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම හා කොටස් ගෙවීම් ලෙස ගෙවන ලද පිළිවෙලින් වටිනාකම රු.මිලියන 9.07 හා රු.මිලියන 0.76 ක් අනාර්ථික ලෙස සලකන ලදී .

(ආ) රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව සඳහා ඉදිකරන ලද ගොඩනැගිල්ලට පිවිසීමේ මාර්ගය ඉදිකිරීම සඳහා රු.මිලියන 1.66 ක් වූ අමතර පිරිවැයක් දරන ලදී, මේ හේතුවෙන් ගොඩනැගිල්ලේ ප්‍රධාන පිවිසුම ප්‍රධාන මාර්ගයේ විරුද්ධ පසට යොමු විය.

(ඇ) දාදුහැතැම්ම - කපරුල්ල මාර්ගයේ කිලෝමීටර් 0+320 සිට කිලෝමීටර් 0+375 දක්වා වු ස්ථාන සහ කිලෝමීටර් 1+330.6 සිට කිලෝමීටර් 1+390 දක්වා වූ ස්ථාන වල මීටර් 250 සිට මීටර් 300.6 දක්වා වූ පරාසයක ඉරිතැලීම් කිහිපයක් 2015 අගෝස්තු 13 විගණකයින් විසින් සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. ගුණාත්මක පරීක්ෂණයක්

නොකර මාර්ග වැඩ සඳහා ප්‍රමිතියෙන් තොර කොන්ක්‍රීට් භාවිතා කර ඇති බව මෙයින් නිරූපනය වේ.

### 3.4 <u>නිෂ්ඵල ගනුදෙනු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) ඉමදූව ප්‍රාදේශීය සභාවේ වෙළඳ කුටි 12 ක්, ප්‍රජා ශාලාව හා අනෙකුත් කාර්යයන් නැවත ඉදිකිරීමේ කාර්යය නාය යෑමේ අවදානම හේතුවෙන් 2015 ජූනි අත්හැර ඇති බව සහ ප්‍රමාණවත් භූමි සමීක්ෂණයක් සිදු නොකර වැඩබිම තෝරා ගෙන ඇති බවත් අනාවරණය විය. මේ හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවන ලද එකතුව රු.මිලියන 3.9 ක් නිෂ්ඵල වියදමක් ලෙස නිරීක්ෂණය විය.

(ආ) ව්‍යාපෘතියේ කටයුතුවලට ඍජුව සම්බන්ධ නොවන දෘශ්‍ය වැඩසටහන්, රූපවාහිනී වැඩසටහන්, වෙළඳ දැන්වීම් වැනි කාර්යයන් සඳහා එකතු පිරිවැය රු.මිලියන 2.26 ක් දරා ඇති බව හා ඒ අනුව ණය මුදලින් රු.මිලියන 2.01 ක් ප්‍රතිපූර්ණය කර ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) වෙනත් ව්‍යාපෘතියක ව්‍යාපෘති අධ්‍යක්ෂක ලෙස කටයුතු කරන ලද ව්‍යාපෘතියේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක ප්‍රවාහන දීමනා ලෙස රු.90,000 ක් හා ඉන්ධන දීමනා ලෙස රු.56,520 ක් සමාලෝචිත වර්ෂයේ මාස තුනක කාලපරිච්ඡේදයක් සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලද දායකයෙන් ලබා ගෙන තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 371 ට අනුව, වෙනත් අත්තිකාරමක් ලබා ගැනීමට ප්‍රථමව පෙර අත්තිකාරම පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතියේ අධ්‍යක්ෂක හා ලේකම් විසින් රු.450,491 ක හා රු.425,650 ක අත්තිකාරම් පෙර අත්තිකාරම් පියවීමකින් තොරව ලබාගෙන තිබුණි.